**වවුනියා දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා නවය - 2022**

---

## 1. විගණන මතය

1.1 වවුනියා දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා නවයක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2022 වර්ෂයට අදාළව වවුනියා දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09ට අදාලව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම කාරක සභා 09 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළු ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙට්ටිකුලම් ගොවිජන සේවා කාරක සභාවේ ගිණුම් පවත්වා ගැනීම සඳහා වූ මාර්ගෝපදේශ චක්‍රලේඛ අංක 107 ප්‍රකාරව ගොඩනැගිලි හා යනෝත්‍රාපකරණ සඳහා පිළිවෙලින් සියයට 5ක් හා සියයට 20ක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කළයුතු වුවත්, හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය ගණනය කර තිබුණි. | චක්රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙට්ටිකුලම් ගොවිජන සේවා කාරක සභාවේ ලැබිය යුතු පාඩු බීජ වී තොග සහ රසායන තොග එකතුව රු.246,690ක් වර්ෂ 15 සිට 22ක් දක්වා කාලයක් ලැබිය යුතු ගිණුම්වල ඉදිරිපත් කර තිබූ අතර මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල කාලපරිච්ඡේදයේ සේවය කළ ගොවිජන සංවර්ධන නිලධාරි විසින් විධිමත්ව වත්කම් හා වගකීම් අළුතින් පැමිණි නිලධාරියාට භාර නොදීම හේතුවෙන් මෙම කරුණ ලැබිය යුතු පාඩු ලෙස දක්වා ඇත. | නීති, රීතිවලට අනුකූලව ගිණුම්වලින් ඉවත් කිරීමට පියවර ගතයුතු වේ. |
| (ආ) | සම්පූර්ණයෙන් ක්ෂය කළ පිරිවැය එකතුව රු. 9,600,000ක් වූ ට්‍රැක්ටර් 08ක් කෝවිල්කුලම් ගොවිජන | ට්‍රැක්ටර්වල වටිනාකම තක්සේරු කර දෙන ලෙසට තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දී | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නිවැරදි වටිනාකම් |

| | | |
|---|---|---|
| සේවා මධ්‍යස්ථානය විසින් පරිහරණය කරමින් පැවැති නමුත් එහි පිරිවැය ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් අනාවරණය කර තිබුණි. | තිබුණද ඔවුන් විසින් නියමිත කාලය තුළ අදාල වටිනාකම් ගණනය කර ලබාදී නොතිබුණි. | ලබාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතු වේ. |

1.3.3 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මධ්‍යස්ථාන 08ක ලැබීම් හා ගෙවීම් ශේෂවල එකතුව රු.27,354,372ක් ලෙස දක්වා තිබූ නමුත් එවා තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොලැබීම හේතුවෙන් එහි නිවැරදිතාවය විගණනයේදී සනාථ කළ නොහැකි වී තිබුණි. | මෙම ගිණුම්වලට අදාල තහවුරු කිරීමේ ලිපිලේඛන යුද්ධය පැවැති කාලපරිච්ඡේදයේදී විනාශ වී ගිය බැවින් හා දත්ත ප්‍රමාණවත් ලෙස නොලැබීමෙන් මෙම ගිණුම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්හැරීමට කටයුතු කරමින් පවතී. | අදාල ශේෂ පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කළයුතු වේ. |

## 1.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | **නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 2020 ජුනි 25 දිනැති අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 07ක ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප මුදල් ගෙවිය යුතු නිලධාරීන්ගෙන් ඉදිරි කාලයේදී අයකර ගැනීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 110 (1) හා (2) | ගොවිජන සේවා කාරක සභා 04ක් විසින් හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | හානි හා පාඩු පිළිබඳ ලේඛන පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ඇ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා02ක් සතු සියළුම වත්කම් ලේඛනගත කිරීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂවල සියළුම වත්කම් ලේඛනගත කිරීමට පියවර ගෙන ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කාරක සභාවල ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් එකතුව රු. 2,549,466 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් එකතුව රු.5,528,844ක් සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,979,378ක වර්ධනයක් පැවතුණි. 2022 වර්ෂයේ අළුතින් ආරම්භ කළ ගුරුක්කල් පුදුක්කුලම් ගොවිජන සේවා මධ්‍යස්ථානයේ වියදම ඉක්මවූ ආදායම රු. 1,502,820ක් වීම මේ සඳහා හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 04ක් විසින් වැව්වල මායිම් සලකුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ මායිම් ගල් 1929ක් රු. 1,390,350කට මිලදී ගෙන තිබුණි. එසේවුවත්, ගල් 1924ක් අදාල අරමුණු සඳහා භාවිතා නොකර මධ්‍යස්ථානයේ තිබූ බව නිරීක්ෂණය විය. | ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් මිලදී ගත් මායිම් ගල් වැව්වල මායිම්වලට දැමීමට තීරණය කර තිබෙන අතර මේ පිළිබඳ ක්‍රියාමාර්ග කඩිනමින් ගනු ලැබේ. | මායිම් ගල් කඩිනමින් භාවිතා කිරීමට පියවර ගතයුතු වේ. |
| (ආ) | ඕමන්ත ගොවිජන සේවා කාරක සභාවේ විනාශයට පත්වූ කෘෂි යෙදවුම් ලෙස දීර්ඝ කාලයක සිට ඉදිරිපත් කරමින් පවතින වර්ග 03ක තොග එකතුව රු. 1,130,070ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ගිණුම් සම්බන්ධයෙන් තහවුරු කිරීමේ ලිපිලේඛන යුද්ධය හේතුවෙන් විනාශ වී ගිය බැවින් මෙම ගිණුම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්හැරීමට හෝ කපාහැරීමට කටයුතු කරමින් පවතී. | අදාල ශේෂ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |
| (ඇ) | ඕමන්ත ගොවිජන සේවා කාරක සභාවේ වර්ෂ 25කට අධික කාලයක් අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ විකුණුම් මධ්‍යස්ථාන ගොඩනැගිලි අත්තිකාරම් රු.125,000ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ගිණුම් සම්බන්ධයෙන් තහවුරු කිරීමේ ලිපිලේඛන යුද්ධය හේතුවෙන් විනාශ වී ගිය බැවින් මෙම ගිණුම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්හැරීමට හෝ කපාහැරීමට කටයුතු කරමින් පවතී. | අදාල ශේෂ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |
| (ඈ) | උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ ට්‍රැක්ටර් අළුත්වැඩියා කුලී ලෙස අත්තිකාරම් ලබාදී තිබූ රු.207,432ක් සම්බන්ධයෙන් ඕමන්ත ගොවිජන සේවා කාරක සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ගිණුම් සම්බන්ධයෙන් තහවුරු කිරීමේ ලිපිලේඛන යුද්ධය හේතුවෙන් විනාශ වී ගිය බැවින් මෙම ගිණුම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්හැරීමට හෝ කපාහැරීමට කටයුතු කරමින් පවතී. | අදාල ශේෂ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |
| (ඉ) | අතිරික්ත අරමුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට ක්‍රියාමාර්ග නොගැනීම නිසා නෙඩුන්කේනි ගොවිජන සේවා කාරක සභාවේ | අතිරික්ත අරමුදල් ඉදිරි කාලයේදී ආයෝජනය කිරීමට පියවර ගනු ලැබේ. | රජයේ අරමුදල් ඵලදායි අයුරින් උපයෝජනය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | රු.8,217,420ක් සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම ගිණුමක පැවතුණි. | | |
| (ඊ) | කෝවිල්කුලම් ගොවිජන සේවා කාරක සභාවේ ඉඩම් 05ක අයිතිය සනාථ කිරීමේ ලිපිලේඛන ලබාගෙන නොමැති අතර ඉන් ඉඩම් දෙකක අගය රු.624,050ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වටිනාකම සඳහන් කර තිබුණි. | ගොවිජන සේවා කාරක සභාවට අදාල ඉඩම් 05 සඳහා ලිපිලේඛන ලබාගැනීමේ සාක්ෂි/සහතික අමුණා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යවා ඇත. ස්ථාවර වත්කම්වල වටිනාකම තක්සේරු කර ලබාදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දී තිබූ නමුත් ඔවුන් විසින් ගණනය කර ලබාදී නොමැත. | මධ්‍යස්ථානයට අයත් ඉඩම්වල හිමිකාරිත්වය මධ්‍යස්ථානයේ නමට මාරුකිරීමට පියවර ගතයුතු වේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05ක එකතුව රු.1,314,814ක් වටිනා රසායනික ද්‍රව්‍ය සහ පොහොර කල් ඉකුත් වී තිබුණි. | කල් ඉකුත් වූ පොහොර සහ කෘමි නාශක තොග විනාශ කිරීමට කටයුතු කරමින් පවතී. | කල් ඉකුත් වූ බෙහෙත් හා පොහොර ද්‍රව්‍ය ඉවත් කිරීමට සුදුසු පියවර ගතයුතු වේ. |
| (ආ) | පම්බෙයිමඩු ගොවිජන සේවා කාරක සභාවේ 2008 වර්ෂයේ සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන්ව තිබූ හඳුනානොගත් ශේෂ රු.1,139,910ක් සම්බන්ධයෙන් මේ දක්වා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදී අවශ්‍ය ලිපිලේඛන හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | අදාල ශේෂ සම්බන්ධයෙන් නීතිරීතිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.3 ලැබීම් හා ගෙවීම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 07ක අයකර ගතයුතු එකතුව රු.18,716,779ක් පසුගිය වර්ෂ 01 සිට 11ක් දක්වා අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | සභාව විසින් අයකළ යුතු මුදල් අයකර ගැනීම සඳහා සම්බන්ධිත ආයතන වෙත දැනුම් දී ඇති අතර ඉදිරි වර්ෂවල සම්පූර්ණයෙන් අයකර ගැනීමට පියවර ගනු ලැබේ. | ලැබිය යුතු දැ නියමිත කාලය තුළ අයකර ගැනීමට පියවර ගතයුතු වේ. |
| (ආ) | ගෙවා නිරවුල් කළයුතු රු.13,500,282ක් වටිනා ගෙවීම් | ගෙවා නිරවුල් කළයුතු ගෙවීම් නියමිත ගෙවීම්ලාභීන් | ගෙවා නිරවුල් කළයුතු ගෙවීම් නියමිත කාලය තුළ |

| | | |
|---|---|---|
| 24ක් පසුගිය වර්ෂ 01 සිට 12කට අධික කාලයක් නිරවුල් කිරීමට ගොවිජන සේවා කාරක සභා 05ක් විසින් පියවර ගෙන නොතිබුණි. | විමර්ශණය/පරීක්ෂා කර ගෙවිය යුතු මුදල් ඉදිරි කාලයේදී නියමිත අයට ගෙවා නිරවුල් කිරීමට කරනු ලැබේ. | ගෙවීමට පියවර ගතයුතු වේ. |

3.4 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙට්ටිකුලම් ගොවිජන සේවා කාරක සභාව විසින් සහනාධාර ලෙස ලබාදිය යුතු පොහොර වෙනුවෙන් අය කරගත් රු. 513,580ක් දීර්ඝ කාලයක සිට ප්‍රතිලාභීන්ට නොගෙවා මූල්‍ය ප්‍රකාශනවල ජංගම බැරකම් ලෙස දක්වා තිබුණි. | සහනාධාර පොහොර මුදලට ලබාගත් ප්‍රතිලාභීන්ට ඉහත මුදල් ආපසු ගෙවීමට කටයුතු කරනු ලැබේ. | අදාල මුදල් ප්‍රතිලාභීන්ට ආපසු ගෙවීමට පියවර ගතයුතු වේ. |

**3.5** **වාහන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 07ක ට්‍රැක්ටර්, ට්‍රේලර්, වී අස්වනු නෙලීමේ යන්ත්‍ර සහ යතුරු පැදි වර්ෂ 06 සිට 10කට අධික කාලයක් පරිහරණයට ගත නොහැකි තත්ත්වයේ පැවැති නමුත් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදී වාහන අළුත්වැඩියා කර ධාවනයේ යෙදවීමටත් ට්‍රැක්ටර් තක්සේරු කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමටත් කටයුතු කරමින් පවතී. | වාහන හා උපකරණ අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ වෙනත් සුදුසු පියවරක් ගත යුතු වේ. |
| (ආ) | වවුනියා දිස්ත්‍රික්ලේකම් කාර්යාලය විසින් රු.810,455ක වියදමින් ට්‍රැක්ටරයක් අළුත්වැඩියා කර උලුක්කුලම් ගොවිජන සේවා මධ්‍යස්ථානයට 2022 අගෝස්තු 16 දින භාරදී තිබූ නමුත් අදාල ට්‍රැක්ටරය විගණන දිනය වන 2023 ජූලි 13 දින වන විටත් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවැතුණි. | ට්‍රැක්ටරය ලබාදුන් දිනයේ ආපසු පැමිණීමේදි Hydrolic අක්‍රිය වීම හේතුවෙන් භාවිතා කිරීමට නොහැකි තත්ත්වයේ පැවැතුණි. මේ පිළිබඳව රඹෑව ප්‍රාදේශීය වාරිමාර්ග දෙපාරතමේන්තුවට දුරකථනය මගින් දැනුවත් කළ නමුත් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නා ලදි. | වාහනය භාවිතයට ගැනීමට කටයතු කළ යුතු වේ. |

**3.6** **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේ රු. මිලියන 1.5ක වියදමින් කනගරායන් කුලම්හි ඉදිකළ පොහොර ගබඩාව 2018 | පොහොර ගබඩාව ඵලදායී අයුරින් භාවිතා කිරීමට ප්‍රයත්න දරනු ලැබේ. | පොහොර ගබඩාව භාවිතා කිරීමට පියවර ගතයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ සිට භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | ඕමන්ත ගොවිජන සේවා කාරක සභාව විසින් රු.283,289ක් වැයකර මිලදී ගෙන සම්බන්ධතාවන් සිදු කරගත් අධීක්ෂණ (CCTV) කැමරා වර්ෂයකට අධික කාලයක් අභාවිතව පැවැති අතර ඒවා අළුත්වැඩියා කර භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි. | වහල අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් වැසි සමයේ ජල කාන්දු නිසා විදුලිය සබඳතා ඇනහිට CCTV කැමරා ක්‍රියා කිරීමට නොහැකි අයුරින් පැවැතුණි. වහල අළුත්වැඩියා කාර්යය සඳහා ඇණවුම් අප වෙත එවා ඇත. මේ සමග CCTV ක්‍රියාකරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | වත්කම් අදාල අරමුණු වෙනුවෙන් භාවිතා කළයුතු අතර නඩත්තු කටයුතු නියමිත පරිදි සිදුකළ යුතුවේ. |

### 3.7 වෙනත් සංවිධානවල වත්කම් භාවිතා කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වවුනියා නගර මධ්‍යයේ ඉදිකර ඇති ගොවි/කෘෂි වෙළෙඳ පොල ගොඩනැගිල්ලෙහි අයිතිය කෝවිල්කුලම් මධ්‍යස්ථානය සතුව නොතිබූ නමුත් එය ප්‍රතිසංස්කරණ වියදම් රු.194,866 ක් වෙනුවෙන් ගෙවීම් කිරිම අවිධිමත් ගෙවීමක් බව නිරීක්ෂණය විය. | වවුනියා නගර මධ්‍යයේ ඉදිකර ඇති ගොවි/කෘෂි වෙළෙඳ පොල ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ කාර්යයන් සඳහා අපගේ ලිපියට අනුව පමණක් නියමිත වියදම් සිදුකෙරුණි. මෙම මුදල දිස්ත්‍රික් ගොවිජන සංවිධානයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ප්‍රතිසංස්කරණ වියදම ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළයුතු වේ. |

## 4. වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 08ක් විසින් 2020 ජනවාරි 01 දිනැති අංක 02/2020 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම සකස් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයන්හි ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් සුදුසු වාර්ෂික ක්‍රියාකාරි සැලැසුම් සකස් කර ගොවිජන සේවා මධ්‍යස්ථාන ක්‍රියාකාරකම් ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කළයුතු වේ. |

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව, තිරසාර සංවර්ධන අරමුණු (2030) ළඟාකර ගැනීම සඳහා ගොවිජන සේවා කාරක සභා 08ක් විසින් ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් සිදු කිරිමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයන්හි ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් සුදුසු තිරසාර සංවර්ධන අරමුණු දර්ශකයන් හඳුනාගෙන ඉලක්ක ළඟාකර ගැනීමට විධිමත් සැලැසුම් සකස්කර ගොවිජන සේවා මධ්‍යස්ථාන මෙහෙයුම් ඉදිරියට සිදුකර ගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට පියවර ගතයුතු වේ. |

## 5. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 04ක් විසින් ගොවිජන බැංකුවේ 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන් 1364ක ගෙන් ලැබිය යුතු ණය ශේෂ එකතුව රු. 49,145,512ක් පසුගිය වර්ෂ 01 සිට 11ක් දක්වා කාලයක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයන්හි ණය නියමිත කාලය තුළ අයකර ගැනීමට පියවර ගනු ලැබේ. | ණය නියමිත කාලය තුළ අයකර ගැනීමට පියවර ගතයුතු වේ. |